**ශීර්ෂ 185 - විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය පිළිබඳ**
**විගණකාධිපති වාර්තාව - 2014 වර්ෂය**

-----------------------------------------------------------------------

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා අමාත්‍යාංශයේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ ශිර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

**1.1 විගණන විෂය පථය**

---------------------

විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 ජූලි 10 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

-------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

--------

**2.1 විසර්ජන ගිණුම**

-------------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

------------------------------

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,718 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු.මිලියන 1,135 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව

අමාත්‍යාංශයේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිය රු. මිලියන 583 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 34 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2014 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 209 | 184 | 25 | 12 |
| මූලධන | 1,509 | 951 | 558 | 37 |
| **එකතුව** | **1,718** | **1,135** | **583** | **34** |

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **විෂය අංකය** | **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|---|
| | **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 18501 | 3.00 | 1.58 | 0.50 | 0.97 | 7.00 | 4.94 |

## 2.3 අග්‍රිම ගිණුම

අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනට අංක 7002/0000/00/0419/0013/000 දරන අග්‍රිම ගිණුමේ ශේෂය රු. මිලියන 39 ක් වී තිබුණි.

**2.4 පොදු තැන්පත් ගිණුම**

----------------------

අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනට අංක 6000/0000/00/0015/0187/0000 දරන පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු. මිලියන 39 ක් වී තිබුණි.

**2.5 විගණන නිරීක්ෂණය**

------------------------

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා පොත් අනුව විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3.1 ඡේදයේ සිට 3.10 ඡේදය දක්වා වූ ඡේදවල දක්වා ඇත.

**3. ශීර්ෂය 185 - විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය**

----------------------------------------------------------------

**3.1 අයවැය විචලනය**

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එක් වැය විෂයයක් සඳහා සළසා තිබුණු රු.100,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 24 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 සිට සියයට 65 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.2 අග්‍රිම ගිණුම**

--------------

2015 අප්‍රේල් 30 දින වන විට පියවා නොතිබුණු අග්‍රිම ශේෂ එකතුව රු. මිලියන 39 ක් වී තිබුණි. මෙම ශේෂය 2012 හා 2013 වර්ෂවලදී දැයට කිරුළ වැඩසටහනේ ඉදිකිරීම් 03 කට අදාලව කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකුට ගෙවන ලද නොපියවන ලද අත්තිකාරම් හා අතුරු ගෙවීම් විය.

**3.3 පොදු තැන්පත් ගිණුම**

----------------------

දැයට කිරුළ සඳහා ලැබී තිබුණු රු.මිලියන 39 ක් අදාල කාර්යයන් වෙනුවෙන් නිරවුල් නොකර, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

**3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

අමාත්‍යාංශය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණත් 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම් ප්‍රතිඵලය හා වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්මක් ඉදිරිපත් කර නොතිබුණි.

**3.4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමඟ ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි.

**3.5 බේරුම් නොකළ බැරකම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය විසින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු. මිලියන 523 ක් වූ අතර එම බැරකම් වර්ෂයකට අඩු කාලයකට අදාල විය.

(ආ) පාසැල් පරිගණක විද්‍යාගාර ව්‍යාපෘතිය සඳහා පරිගණක සහ අනෙකුත් උපාංග මිලදී ගැනීම වෙනුවෙන් 185-2-3-1-2502 දරන වැය විෂයය යටතේ සළසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කළ පසු වර්ෂය අවසානයේදී ඉතිරිවූ රු. මිලියන 189.8 ක ප්‍රතිපාදනය ඉක්මවා රු.මිලියන 206.99 ක බැරකම්වලට එළඹ තිබුණි. එම බැරකම්වලින් රු. මිලියන 108.5 ක් 2015 ජූනි 16 දින වන විටත් පියවා නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 94(i) ප්‍රකාරව ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීම නොකළ යුතු වුවත්, වැය විෂයයන් 6 කට සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා රු. මිලියන 17.6 ක බැරකම්වලට එළඹ තිබුණි.

(ඈ) 2015 වර්ෂයේදී ගෙවන ලද 2014 වර්ෂයට අදාල රු.122,315 ක බැරකම්, විසර්ජන ගිණුමේ බැරකම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි.

**3.6 කාර්යසාධනය**

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

සමාලෝචිත වර්ෂය සඳහා වූ කාර්යසාධන වාර්තාවට අනුව දිස්ත්‍රික්ක 07 ක පරිගණක ගුරුවරු 1,262 දෙනෙකු පුහුණු කිරීමට සැලැසුම් කර තිබුණද, දිස්ත්‍රික්ක 3 ක පමණක්

ගුරුවරුන් 894 ක් පුහුණු කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික්ක 4 ක එක් ගුරුවරයෙකු හෝ පුහුණු නොකළ මිස්සක ඉ - නැණ පියස් මධ්‍යස්ථාන සංඛ්‍යාව 60 ක් වී තිබුණි.

**(ආ) සැලැසුම් කිරීම**

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේදී මිස්සක ඉ - නැණ පියස් 441 ක් ස්ථාපිත කිරීමට සැලැසුම් කර තිබුණද, එයින් විද්‍යාගාර 303 ක් පමණක් විවෘත කර තිබුණි.

(ii) මිස්සක දිස්ත්‍රික් තොරතුරු තාක්ෂණ සම්පත් මධ්‍යස්ථාන 10 ක් ස්ථාපිත කිරීමට සැලැසුම් කර තිබුණද, ඉන් මධ්‍යස්ථාන 03 ක් පමණක් ස්ථාපිත කර තිබුණි.

**3.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

---------------------------------

අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන මිස්සක "ඉ"ශිල්පාගාර සඳහා පරිගණක හා පරිගණක උපාංග මිලදී ගැනීමේ කාර්යය අමාත්‍යාංශය මගින් සිදුකර තිබුණි. කෑගල්ල දිස්ත්‍රික්කයේ එක් ජාතික පාසලක් සඳහා පරිගණක 20 ක්, යූපීඑස් 20 ක්, මල්ටිමීඩියා ප්‍රොජෙක්ටරයක් හා ස්කෑනර් යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා රු.2,273,845 ක් හා පරිගණක විද්‍යාගාරය අළුත්වැඩියා කිරීම සඳහා රු. 830,000 ක්ද වශයෙන් එකතුව රු. 3,103,845 ක් කෑගල්ල දිස්ත්‍රික් ලේකම්වරයා වෙත යවා තිබුණි. මෙම පාසලට අධ්‍යාපන අමාත්‍යාංශය මගින්ද පරිගණක සම්පත් මධ්‍යස්ථානයක් ස්ථාපිත කර තිබියදී මිස්සක "ඉ"ශිල්පාගාරයක් ස්ථාපිත කිරීම සඳහා අමාත්‍යාංශය විසින්ද කටයුතු කර තිබුණි. එක් පාසලකට පරිගණක 10 ක් ලබාදීම අමාත්‍යාංශයේ ප්‍රතිපත්තිය වුවද, එයට පටහැනිව මෙම පාසල සඳහා පරිගණක 20 ක් ලබාදී තිබුණි.

**3.8 අවිධිමත් ගනුදෙනු**

--------------------

අමාත්‍යාංශය විසින් සිදුකර තිබූ සමහර ගනුදෙනු විධිමත් බවින් තොරවිය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

--------------------------------------------------------------------------

"ඉ"ශිල්පාගාර 100 ක් සඳහා ඩෙස්ක්ටොප් පරිගණක 1,000 ක්, UPS 1,000 ක්, ඉන්ජෙක්ට් ප්‍රින්ටර්ස් 100 ක්, ෆ්ලැට් බෙඩ් ස්කෑනර් 100 ක්, ස්ක්‍රීන් සමඟ බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍ර 100 ක් මිලදී ගැනීම සඳහා රු. 132,384,173 ක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.1.1(අ) මාර්ගෝපදේශයට අනුව අවම වශයෙන් ලංසු කැඳවීමේ දිනයට පෙර වූ දිනය දක්වා ලංසු ලේඛන ලබාගැනීමට ලංසුකරුවන්ට ඉඩ සළසා දිය යුතු වුවත්, මෙම ප්‍රසම්පාදනයේදී ලංසු ලේඛන ලබාගත හැකි කාල සීමාව සීමාකර තිබුණි.

(ii) දිස්ත්‍රික් 6 ක තෝරාගත් පාසල් 100 ක් සඳහා කාණ්ඩ 3 ක් යටතේ ප්‍රමුඛතාවය අනුව ඉහත පරිගණක, පරිගණක උපාංග හා යන්ත්‍ර මිලදී ගැනීම සඳහා 2014

පෙබරවාරි 13 දින ලංසු කැඳවා තිබුණි. මෙම කාණ්ඩ 3 සඳහා අවම මිල එකම ආයතනයක් විසින් ඉදිරිපත් කර තිබුණි. අවම මිල පදනම් කර නොගෙන ප්‍රමුඛතාවය පදනම් කරගෙන පළමු කාණ්ඩය අවම මිලටත් දෙවන හා තෙවන කාණ්ඩ පිළිවෙලින් දෙවන හා තෙවන මිලටත් ලබාදී තිබුණි. මෙහිදී ප්‍රමුඛතාවය පදනම් කර නොගෙන අවම මිල ඉදිරිපත් කළ ආයතනයට මුළු ප්‍රසම්පාදනය ලබාදුන්නේනම් රජයට රු.5,012,224 ක මූල්‍යමය වාසියක් ලබාගැනීමට හැකියාව තිබුණි.

(iii) දැයට කිරුළ වැඩසටහනට සමගාමීව “ඉ” ශිල්පාගාර විවෘත කිරීමේ දින වකවානුවලට ප්‍රමුඛස්ථානය දෙමින් ප්‍රමාදයන් අවම කරගැනීමේ අරමුණින් ඉහත පරිදි සැපයීම ලබාදී තිබුණද, ගිවිසුම් ප්‍රකාරව නියමිත දිනට භාණ්ඩ සැපයීම සිදුකර නොතිබුණි.

(iv) පරිගණක හා පරිගණක උපාංග ලබාදීම සම්බන්ධයෙන් කෑගල්ල දිස්ත්‍රිකයේ පාසැල් හතරක සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂණයේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- ජාලගත කිරීම සඳහා පාසැල් 03 ක කේබල් සවිකර තිබුණද, අන්තර් ජාල පහසුකම් ලබාදී නොතිබුණු එක් පාසැලක කේබල් සවිකර හෝ නොතිබුණි.

- කෑගල්ල දිස්ත්‍රික්කය සඳහා සමාගම් දෙකක් විසින් පරිගණක හා පරිගණක උපාංග සපයා තිබුණ අතර එක් සැපයුම්කාර සමාගමක් විසින් පරිගණක සැපයීම් කළ යුතු මාදිලියෙන් එක් පාසලකට පරිගණක 04 බැගින් හා වෙනත් මාදිලියකින් පරිගණක 06 බැගින් සපයා තිබුණි.

- එක් පාසලක් සඳහා 2014 සැප්තැම්බර් 04 දින භාරදුන් පරිගණක 10 න් 05 ක් ඔක්තෝබර් 25 දින සිට විගණන දිනය වූ 2015 ජූනි 19 දින දක්වාම ක්‍රියා විරහිතවී තිබුණි.

### 3.9 කළමනාකරණ දුර්වලතා

----------------------------

අමාත්‍යාංශය විසින් සිදුකර තිබූ සමහර ගනුදෙනු සම්බන්ධයෙන් කළ නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) “ඉ” ශිල්පාගාර ස්ථාපිත කරනු ලබන දිස්ත්‍රික්ක හා ඒ එක් එක් දිස්ත්‍රික්කවලින් තෝරාගනු ලබන පාසැල් තෝරා ගැනීමේ නිශ්චිත පදනමක් නොතිබුණු අතර දැයට කිරුළ වැඩසටහනට සමගාමීව තෝරාගත් පාසැල්ද නිතර නිතර වෙනස්වීම්වලට භාජනය වී තිබුණි.

(ආ) 2014 වර්ෂයේදී අම්පාර, කෑගල්ල, මඩකළපුව, හම්බන්තොට, පොළොන්නරුව හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක 6 සඳහා පරිගණක මධ්‍යස්ථාන 267 ක් ඉදිකිරීමට

සැලැසුම්කර තිබුණද, එයින් මධ්‍යස්ථාන 100 ක් කෑගල්ල දිස්ත්‍රික්කයේ පාසැල් සඳහාද, මධ්‍යස්ථාන 115 ක් අම්පාර දිස්ත්‍රික්කය සඳහාද විය. 2013 වර්ෂයේදී ඉදිකිරීමට සැලැසුම් කර තිබූ පරිගණක මධ්‍යස්ථාන 92 න් මධ්‍යස්ථාන 70 ක් කෑගල්ල දිස්ත්‍රික්කයේ ස්ථාපිත කර තිබුණි. ඒ අනුව සම්පත් බෙදීම අසමාන අයුරින් සිදුකර තිබුණි.

(ඇ) 2013 හා 2014 වර්ෂවලදී නැණසල මධ්‍යස්ථාන 137 ක් ඇතුළුව මුළු නැණසල මධ්‍යස්ථාන 1,005 ක් ස්ථාපිත කර ඇති බව වාර්තා කර තිබුණද, මෙම නැණසල මධ්‍යස්ථානයන් සඳහා ලබාදී තිබුණු පරිගණක, පරිගණක උපාංග හා අනෙකුත් උපකරණ සම්බන්ධයෙන් විස්තර වාර්තා අමාත්‍යාංශය සතුව නොතිබුණි.

(ඈ) 1991 සැප්තැම්බර් 01 දින විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ වත්කම් හා බැරකම් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට පවරා ගත්තද, විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ සේවය කරන ලද සේවකයින්ගේ දරුවන්වෙනුවෙන් ආරම්භ කර තිබූ බාල වයස්කාර ගිණුම්වලින් 2014 අගෝස්තු 31 දින වන විට රු.78,027 ක් වටිනා බාල වයස්කාර ගිණුම් 60 ක් නිදහස් කර නොතිබුණි.

## 3.10 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 09 | 08 | 01 |
| (ii) | තෘතීයික මට්ටම | 30 | 02 | 28 |
| (iii) | ද්විතික මට්ටම | 33 | 21 | 12 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 20 | 16 | 04 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 01 | 01 | - |
| | **එකතුව** | **93** | **48** | **45** |

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පුරප්පාඩු 45ක් පිරවීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.